## 1.1 හැඳින්වීම

පරිපූර්ණ මිනිසෙකු ලෙස භාවමය හා සෞන්දර්යාත්මක අනුභූතීන් ප්‍රකාශ කිරීමෙහිලා නර්තන විෂය ඉතා ප්‍රබල මාධ්‍යක් බවට පත් වී තිබේ. මිනිස් මනස හා සිතැඟ සමගින් ආත්මීයව බැඳෙමින් සෞන්දර්යාත්මක හැඟීම් නිර්මාණයෙහිලා මෙන්ම වින්දනයෙහි ද පුරෝගාමී වන්නාවූ මෙමගින් නර්තනය ශුද්ධකරවූ ලබන අතර යහපැවතුම් පිරි සමාජ පරිසරයක් ද නිර්මාණය කරනු ලබයි.

"නර්තනය" යන්න ප්‍රාථමික කාල සමාජ ස්ථරයේ සිට ශිෂ්ට සමාජ ස්ථරය තෙක් ආ ගමන් මගෙහි විකාශනය වූ ක්‍රියා පද්ධතියකි. ඉංග්‍රීසි බසින් "DANCE" යන්නට එම සමාජ ව්‍යවහාරයෙහි සම්භාව්‍ය අර්ථකථනයක් ලැබෙන අතර, දේශීය වශයෙන් බැලූ කල ඒ උදෙසා ලැබී ඇති අර්ථකථනය සම්භාව්‍ය ගණයෙහිලා සැළකිය හැකිවේ ද? නැතුයි. නැටීම යනුවෙන් ලැබූ හැඳින්වීම අර්ථ පූර්ණ කිරීම උදෙසා "නර්තනය" යන පදයෙන් ශිෂ්ට අර්ථකථනයක් මේ සඳහා ලබාදෙනු ලැබේ.

මිනිසාගේ පැවැත්ම උදෙසා මූලික මිනිස් අවශ්‍යතාවයන් අවශ්‍යවන්නා සේම, මිනිසාගේ යහපැවැත්ම උදෙසා කලාව යන්න අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ පිළිබඳව වූ සාමාජීය අවශ්‍යතාවය එදා සිට අද දක්වා පැමිණි කලාවන්හි විවිධාකාර වූ ස්වභාවයන් හරහා ගම්‍යවේ. විවිධ වෙනස්වීම්වලට බඳුන් වූ නර්තනය ද මිනිසාගේ සමකාලීන වින්දනයන්, අවශ්‍යතාවයන් සමග වෙනස්වන්නට විය.

"නර්තනය" යන්න විවිධ අයුරින් හැඳින්වීම්වලට බඳුන් වූ විෂයක් වන අතර ඒ පිළිබඳව විවිධ වූ නිර්වචන ඉදිරිපත් වී තිබේ. යම් කිසි අර්ථයක් ප්‍රකාශවන පරිදි හෝ නොවන පරිදි තාලානුකූලව හෝ තාලානුකූල නොවන පරිදි, ප්‍රකාශනාත්මක හෝ ප්‍රකාශනාත්මක නොවන පරිදි ශරීරාංග, ප්‍රත්‍යංග, උපාංග මාධ්‍ය කොටගෙන දැක්වීම නර්තනය ලෙස දක්වා ඇති එක් නිර්වචනයකි.

එමෙන්ම ශරීරයේ චලන ක්‍රියාකාරීත්වය තුළින් භාව ප්‍රකාශන නිරූපනයක් සිදුවන්නාවූ බව නිරූපිතය. එමෙන් අවකාශය තුළ රටාමැවීමක් ලෙසද නර්තනය හඳුන්වා දෙනු ලැබේ. කෙසේවූද, මිනිස් මනස හා ආත්මීයව බැඳෙන්නාවූ ත්, මිනිස් වින්දනය පුබුදු කරන්නාවූත්,

සුඛනම්‍ය මටසිළුටු කලාවක් වශයෙන් සැළකෙන ලලිත කලාවන් අතරින් නර්තනය සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනියි.

මිනිසා නැවත නැවත නවතාවයෙන් බිහිවන්නේ අධ්‍යාපනය නම් වූ ක්‍රියාදාමයත් සමග බැදී ඇත්තාවූ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයෙනි. රටක අධ්‍යාපනය සකස්විය යුත්තේද ළමයාගේ පරතන්ත්‍ර චින්තනය යටපත් වෙමින් කෙමෙන් ස්වතන්ත්‍රතාවී චින්තනය ඉස්මතු වන්නා වූ ආකාරයට වන අතර, සෞන්දර්ය අධ්‍යාපනය මිනිසා තුළ පවතින්නාවූ ශක්තීන් මැනවින් ග්‍රහණය කර ගැනීමට සමත්කමක් දක්වන්නා වූ විෂය ක්ෂේත්‍රයකි.

එසේම නර්තන අධ්‍යාපනය හරහා දැනුම, ආකල්ප, කුසලතා සම්බරව වර්ධනයද අපේක්ෂාව වේ. සෞන්දර්ය අධ්‍යාපනය වඩාත් ප්‍රායෝගික අංශය වෙත නැඹුරුතාවයකින් යුතු වීම තුළින් සිසුන් තුළ ප්‍රායෝගික භාවිතය වැඩිවන අතර ශාරීරික මෙන්ම මානසික ක්‍රියාකාරීත්වය තුළින් විචාරාත්මක ශක්තිවර්ධනයටද එය උපකාරී වේ. එමෙන්ම පුද්ගලයන් සතු නිර්මාණාත්මකභාවය හා රසවින්දන හැකියාව ඉතා සියුම් ක්‍රමෝපායන් තුළින් උද්දීපනය කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමට අධ්‍යාපනය මහගු දායකත්වයක් සපයනු ලැබේ.

ගුරු ගෘහිය වූ අධ්‍යාපන රටාවකින් ඇරඹි නර්තන අධ්‍යාපන ගමන්මග අද්‍යතනයේ දී ඉතා ඉහළ ස්ථානයක් දරන අතර අතීතයට වඩා පුළුල්වූ අරමුණු හා අභිමතාර්ථ එමගින් ඉටුකර ගැනීමට යත්න දරයි. මෙතෙක්ආ ගමන් මගෙහි නර්තන විෂය විවිධ ප්‍රතිසංස්කරණයට බඳුන් වූ අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන්ද කාලානුරූපව වෙනස් විය. මෙසේ වෙනස් වෙමින් විකාශනය වන්නාවූ නර්තන අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මනක පසුබිම, ගුරු කාර්යභාරය, සම්පත් භාවිතය යනාදිය ඉතා වැදගත් අංග ලෙස එකතුවූවක් විය. මෙම අංශයන් කෙරෙහි පුළුල් අවධානයක් මෙම නිබන්ධයේ යොමුකොට තිබේ.

පුද්ගලයාගේ ආකල්ප වර්ධනයෙහිලා සෞන්දර්ය විෂයන් පරිශිලනය හා අධ්‍යයනය මහත් රුකුලක් වන්නාසේම ඒ හා සමගාමීව අධ්‍යාපන ක්‍රමවේදයන්, විෂය පථයන්, සුදුසු අයුරින් ද නිර්මාණය කළයුතු වේ. වැඩිහිටියන් මත පරායත්ත නොවී ස්වාධීන චින්තනයක් ගොඩ නැංවීමෙහි ලා පාසල් නර්තන විෂය ක්ෂේත්‍රය කෙසේ සකස්විය යුතුද, එමෙන්ම තත්කාලීන විෂය නිර්දේශ ඉහත අරමුණු කරා ලගාවී ඇද්ද යන්න අධ්‍යයනය කිරීමක් සිදුකිරීම අපේක්ෂිතය.